# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවට අදාළ ක්‍රියාකාරකම්**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 03 - ව්‍යාපාර සංවිධාන**

**ඒක පුද්ගල ව්‍යාපාර**

..............................................................................................................................

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක i සිට v දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

මැහුම් පාඨමාලාවක් සාර්ථක ව නිම කළ මනුරි පෙරේරා තමා ඉතිරි කර ගත් රු. 100 000 ක මුදලක් ද රු. 75 000 ක් වටිනා මහන මැෂිමක් ද යොදවා "මනුරි ෆැෂන්" නමින් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යයි. පෙරේරා මහත්මියගේ දක්ෂතාව හා කැපවීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු දිනෙන් දින දියුණුවට පත් වූ බැවින් වෙළෙඳසැලේ කටයුතු කිරීමට සේවිකාවක් ද බඳවා ගන්නා ලදී.

i. "මනුරි ෆැෂන්" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?
ii. එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ 2ක් සඳහන් කරන්න.
iii. එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ දක්නට ලැබෙන වාසි 2ක් ලියා දක්වන්න.
iv. එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ දක්නට ලැබෙන අවාසි 2ක් ලියා දක්වන්න.
v. **"මනුරි ෆැෂන් ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු නැත."**
(අ). ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද?
(ආ). ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**02. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**

(අ). ඒක පුද්ගල ව්‍යාපාරයක උපයන සියලුම ලාභ අයිතිකරු සතු වේ. ( )
(ආ). අයිතිකරුගේ වගකීම අසීමිත වීම ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියකි. ( )
(ඉ). අයිතිකරු මිය යාම හෝ උමතු වීම වැනි හේතු නිසා ඒක පුද්ගල ව්‍යාපාර අවසන් විය හැකි ය. ( )
(ඊ). ඒක පුද්ගල ව්‍යාපාරයකට ව්‍යාපාරය නමින් නීතිමය කටයුතුවල යෙදිය නොහැකි ය. ( )

**03. කෙටි පිළිතුරු සපයන්න.**

1. ඒක පුද්ගල ව්‍යාපාර යනු කුමක්ද?
2. ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන වර්ගය බහුලව දක්නට ලැබේ. හේතු 2ක් දක්වන්න.
3. "අයිතිකරුගේ වගකීම අසීමිත වීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
4. ඒක පුද්ගල ව්‍යාපාරයකට "නෛතික පුද්ගලභාවයක් නොමැත"යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

**04. නිවැරදි පිළිතුර තෝරන්න.**

1. ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් වන්නේ,

(1). අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම ය.
(2). නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම ය.
(3). තීරණ ගැනීමේ ස්වාධීන බව ය.
(4). අයිතිකරුගේ වගකීම අසීමිත වීම ය.

2. ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසියක් වන්නේ,

(1). සියලුම ලාභ අයිතිකරු සතු වීම ය.
(2). අයිතිකරුගේ වගකීම අසීමිත වීම ය.
(3). තනිව තීරණ ගත හැකි වීම ය.
(4). පහසුවෙන් ආරම්භ කළ හැකි වීම ය.

3. ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ ලක්ෂණයක් **නොවන්නේ,**

(1). ලාභ අලාභ තනි ව භුක්ති විඳීම ය.
(2). නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම ය.
(3). අයිතිකරුගේ වගකීම සීමිත වීම ය.
(4). ලියාපදිංචිය අනිවාර්ය නොවීම ය.

4. ඒක පුද්ගල ව්‍යාපාරයක හිමිකාරිත්වය,

(1). තනි පුද්ගලයෙකු සතු වේ.
(2). පුද්ගලයන් දෙදෙනෙකු සතු වේ.
(3). පුද්ගලයන් කිහිපදෙනෙකු සතු වේ.
(4). රජය සතු වේ.

5. ඒක පුද්ගල ව්‍යාපාර හැඳින්විය හැකි තවත් ආකාරයක් වන්නේ,

(1). හවුල් ව්‍යාපාර ලෙස ය.
(2). තනි පුද්ගල ව්‍යාපාර ලෙස ය.
(3). පොදු අංශයේ ව්‍යාපාර ලෙස ය.
(4). සිල්ලර වෙළෙඳ ව්‍යාපාර ලෙස ය.

**05.** ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන ඒක පුද්ගල ව්‍යාපාරයක් තෝරා ගෙන එම ව්‍යාපාරය ඇසුරෙන් ඒක පුද්ගල ව්‍යාපාරයක වාසි අවාසි පිළිබඳ අධ්‍යයනය කරන්න.